# 06. වන්දනා ගාථා

## පඨමො පාඨො



**නමාමි** බුද්ධං ගුණසාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී අවෙරා
කායො ජිගුච්ඡො සකලො දුගන්ධො
**ගච්ඡන්ති** සබ්බෙ මරණං අහඤ්ච.

**වන්දාමි** චෙතියං සබ්බං
සබ්බට්ඨානෙසු පතිට්ඨිතං
සාරීරිකධාතු මහාබොධිං
බුද්ධරූපං සකලං සදා

ඝනසාරප්පදිත්තෙන - දීපෙන තමධංසිනා
තිලොකදීපං සම්බුද්ධං - **පූජයාමි** තමොනුදං

සුගන්ධිකාය වදනං - අනන්තගුණගන්ධිනා
සුගන්ධිනා'හං ගන්ධෙන - **පූජයාමි** තථාගතං

**පූජෙමි** බුද්ධං කුසුමෙනනෙන - පුඤ්ඤෙනමෙතෙන **ලභාමි** මොක්ඛං
පුප්ඵං **මිලායාති** යථා ඉදංමෙ - කායො තථා **යාති** විනාසභාවං

### වචන මාලාව

1. ගුණසාගරන්තං - ඒ ගුණ සාගරයට
2. සදා - සැමදා
3. අවෙර - වෛර නැති
4. ජිගුච්ඡ - පිළිකුල්

5. සබ්බඨාන - සියලු තැන

6. පතිට්ඨිත - පිහිටියා වූ

7. ඝනසාර - කපුරු

8. පදිත්ත - දල්වන ලද

9. දීප - පහන

10. තමධංසි - අඳුර නසන

11. තමොනුද - අඳුර නසන (මෝහ නමැති)

12. සුගන්ධිකාය වදනං - සුවඳවත් මුව කමලක් ඇති

13. අනන්තගුණගන්ධිනං - අනන්ත ගුණයෙන් සුවඳවත් වූ

14. මිලායාති - මැලවෙයි

15. යථා - යම් සේ

16. තථා - එසේ

17. යාති - යයි

## ක්‍රියා පද

වාක්‍ය ලිවීම සඳහා නාම පද මෙන් ම ක්‍රියා පද ද අපට අවශ්‍ය වෙයි. දැන් අපි වර්තමාන කාලයේ ක්‍රියා පද පිළිබඳ වටහා ගනිමු. වර්තමාන කාලය යනු දැන් පවත්නා කාලය යි. වර්තමාන කාල ක්‍රියා පදයක් අපට පුරුෂ තුනෙහි වෙන් වෙන් ව බෙදා දැක්විය හැකි ය. ඒ පුරුෂවලට අයත් වර්තමාන කාලයේ ප්‍රත්‍යයන් හයක් (6) ඇත. ඒවා මෙසේ ය.

## වර්තමාන කාලයේ ක්‍රියා පද සෑදීම

**වර්තමාන කාලික පරස්සපද ප්‍රත්‍ය මාලාව**

| පුරිස | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨම පුරිස | ති | න්ති |
| මජ්ඣිම පුරිස | සි | ථ |
| උත්තම පුරිස | මි | ම |

- මෙම පාඩමේ අප කියවූ ගාථාවේ "**මිලායාති, ගච්ඡන්ති, නමාමි**" වශයෙන් ක්‍රියා පද තුනක් දක්නට ලැබුණි.
- ඒවා වර්තමාන කාලයට අයත් ය.

**වර්තමාන කාල ක්‍රියා පදයක් පුරුෂ තුනෙහි වරනැගෙන අයුරු බලන්න.**

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **පඨම පුරිස** | භාසති | භාසන්ති |
| **මජ්ඣිම පුරිස** | භාසසි | භාසථ |
| **උත්තම පුරිස** | භාසාමි | භාසාම |

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප්‍රථම පුරුෂ** | කියයි | කියති |
| **මධ්‍යම පුරුෂ** | කියහි | කියහු |
| **උත්තම පුරුෂ** | කියමි | කියමු |

ක්‍රියාපද භාවිතය පහසු කරගැනීමට අපට නාම පද පුරුෂ තුනෙහි යෙදෙන අයුරු දැනගැනීම වැදගත් වෙයි. ප්‍රථම පුරුෂයේ නාම පදයක් උක්ත වී ඇති විට එම පුරුෂයේ ම ක්‍රියාපදයක් යෙදිය යුතු ය. මධ්‍යම පුරුෂයේ නාම පදයක් උක්ත වී ඇති විට එම පුරුෂයේ ම ක්‍රියාපදයක් යෙදිය යුතු ය. උත්තම පුරුෂයේ ද එසේම ය. පහත වගුව බලා එය තහවුරු කර ගන්න.

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨම පුරිස | සො/ (ඔහු) හෙතෙම<br>මනුසෙසා (මිනිසා)<br>(සියලු ඒකවචන නාම පද) | තෙ/ ඔවුහු<br>(මනුසසා/ මිනිස්සු)<br>(සියලු බහුවචන නාම පද) |
| මජ්ඣිම පුරිස | ත්වං<br>(ඔබ වහන්සේ, නුඹ,<br>ඔබ, තෝ) | තුමෙහ<br>(ඔබ වහන්සේලා, නුඹලා,<br>ඔබලා, තෙපි,) |
| උත්තම පුරිස | අහං<br>(මම) | මයං<br>(අපි) |

**ඉහත වගු දෙස බලා අපි සරල වාක්‍ය නිර්මාණය උගනිමු.**

උදා :-

01. ඔහු කියයි. - සො වදති.

02. මිනිස්සු කියති. - මනුස්සා වදන්ති.

03. නුඹ කියහි - ත්වං වදසි.

04. නුඹලා කියහු. - තුම්හෙ වදථ.

05. මම කියමි. - අහං වදමි.

06. අපි කියමු. - මයං වදම.

**සර්ව නාම පදයක් හා නාම පදයක් යොදා වාක්‍ය නිර්මාණය කරන අයුරු බලන්න.**

- සො ගොපාලො හොති - හෙතෙම ගොපල්ලෙකි.
- අහං භික්ඛු භවාමි - මම භික්ෂුවක්මි.
- අයං රුක්ඛො පතති - මේ ගස වැටෙයි.
- කො ත්වං අසි - ඔබ කවුද?
- ඉමානි අක්ඛරාණි හොන්ති - මේවා අකුරු.

## අභ්‍යාසය 06 1

1. පහත සඳහන් වගන්ති සිංහලට නගන්න.

    1. බුද්ධා දෙසෙති.
    2. දෙවා භාසන්ති.
    3. මනුස්සා කරොන්ති.
    4. සො කරොති.
    5. ත්වං කරොසි.

2. පහත සඳහන් වගන්ති පාලියට නගන්න.

    1. මව සෝදයි.
    2. මම දුවමි.
    3. නුඹලා බලහු.
    4. භික්ෂුව සක්මන් කරයි.
    5. බුදුවරු දේශනා කරති.

3. නාම පද හා ක්‍රියා පද නිවැරැදි ව ගළපා, පාලි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.
4. සර්ව නාම පද හා නාම පද ගළපා වාක්‍ය පහක් නිර්මාණ කරන්න.
5. ඔබ කැමති ක්‍රියා පද දෙකක් වර්තමාන කාලයේ පුරුෂ තුනෙහි වරනගා අර්ථය ලියන්න.

**මෙම ක්‍රියාපදවල අර්ථ පාඩම් කරන්න.**

1. ගච්ඡති - යයි
2. ආගච්ඡති - එයි
3. ධාවති - දුවයි
4. ඛාදති - කයි
5. පඨති - පාඩම් කරයි
6. ලිඛති - ලියයි
7. භාසති - කියයි
8. කරොති - කරයි
9. හසති - සිනාසෙයි
10. තිට්ඨති - සිටියි
11. චංකමති - සක්මන් කරයි
12. දෙසෙති - දේශනා කරයි
13. සයති - නිදයි
14. පස්සති - බලයි
15. පටිබුජ්ඣති - අවදි වෙයි
16. ධොවති - සෝදයි
17. භුඤ්ජති - අනුභව කරයි/වළඳයි
18. නිසීදති - හිඳියි
19. හරති - ගෙන යයි
20. පූජෙති - පුදයි